G
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE
අංක. 109, මහ විදිය, බත්තරමුල්ල இல.109, பிரதான வீதி, பத்தரமுள்ள No. 109, Maha Veediya, Battaramulla

මගේ යොමුව / எனது இல. / My Ref. } WPC/PSC/REC01/කා. ක..ඉ.පොදු ගොණුවඹබේ යොමුව / உமது இல. / Your Ref. }    දිනය / திகதி / Date } 2019.02.

ප්‍රධාන ලේකම් (බ.ප) ,
ආණ්ඩුකාර ලේකම් (බ.ප)
සභා ලේකම්, (බ.ප)
ලේකම්, පළාත් පාලන අමාත්‍යංශය (බ.ප)
ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය (බ.ප)
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය (බ.ප)
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යංශය (බ.ප)
ලේකම්, මාර්ග අමාත්‍යංශය (බ.ප)

**<u>මාර්ගගත ක්‍රමය යටතේ (On Line) කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් කැඳවීම</u>**

පහත සඳහන් තනතුරු සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02 එම අයදුම්පත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මගින් මාර්ගගත ක්‍රමය මගින් (On Line) **2019.03.14** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් 2019.03.21 දිනට පෙර ආයතන ප්‍රධානියා මගින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය, මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03 පළමු වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.ඉන්පසුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ගාස්තු ලෙස , පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

| | |
|---|---|
| විෂයයන් 04 සහිත විභාග සඳහා | එක් විෂයකට විභාග ගාස්තු රු. 300/= |
| | විෂයයන් දෙකකට විභාග ගාස්තු රු. 400/= |
| | විෂයයන් තුනකට විභාග ගාස්තු රු. 500/= |
| | සම්පූර්ණ විභාය සඳහා රු. 600/= |
| විෂයයන් 03 සහිත විභාග සඳහා | එක් විෂයයකට විභාග ගාස්තු රු. 400/= |
| | විෂයයන් දෙකකට විභාග ගාස්තු රු. 500/= |
| | සම්පූර්ණ විභාග සඳහා රු. 600/= |
| විෂයයන් 02 සහිත විභාග සඳහා | එක් විෂයකට විභාග ගාස්තු රු. 500/= |
| | සම්පූර්ණ විභාය සඳහා රු. 600/= |
| එක් විෂයයක් සහිත විභාග සඳහා | රු. 600/= |

04 අයදුම්කරුවන් **විසින් බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99** ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ.ප 1 ලදුපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

05 බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සියළුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පමණක් අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් කල යුතු බව අවධාරණය කරනු ලබන අතර අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව මෙම විභාගය සඳහා ඔවුන් සඳහන් කර ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කළා සේ සලකා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

දුරකථන / தொலைபேசி / Telephone }
ලේකම්/செயலாளர் /Secretary 2879528
සහකාර ලේකම්/ உதவிச் செயலாளர்/Asst. Secretary 2879538
සහකාර ලේකම්/உதவி செயலாளர்/Assistant Secretary 2879610
පරිපාලන නිලධාරිනී/நிர்வாக உத்தியோகத்தர்/ Administrative Officer 2879517
කාර්යාලය/அலுவலகம்/ Office 2879614
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2879512
ඊ-මේල් / ஈ-மெயில் / e-mail } ppscwpse@sltnet.lk

06. මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු බව පෙනි ගියහොත් විභාගයට පෙරාතුව , විභාගය පැවැත්වෙද්දි හෝ ඉන්පසුව කවර අවස්ථාවකදී වුවද , ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කල බව පෙනී ගිය හොත් ඔහු/ඇය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති උල්ලංගනය කිරිම වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඩුවමකට යටත් වෙයි.

07 තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපතිට අයදුම්කරු තම අනන්‍යතාව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු හැඳුනුම් පත .
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

සටහන : විභාග ශාලාවේදී සිය අනන්‍යතාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ

08 ප්‍රශ්න පත්‍රයක් සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය හා සමත් ලකුණු සීමාව, අදාල සේවා ව්‍යවස්ථාවේ/ බඳවා ගැනිම් පරිපාටියේ සඳහන් වන ආකාරයට වේ.

09. අවශ්‍ය වුවහොත් මෙම විභාගය සිංහල,දෙමළ,හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ.අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය.

10. රෙගුලාසිවලින් විධිවිධාන සලසා ඇති /නොමැති යම් කරුණක් වෙතොත් , එය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

එම්.ජී.ඒ.තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත

| අංකය | විභාගයේ නම | ශ්‍රේණිය | අදාල කාර්යක්ෂමතා කඩඉම |
|---|---|---|---|
| 1 | සංවර්ධන සහකාර | II | I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 2 | සංවර්ධන සහකාර | I | II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 3 | බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත ඛණ්ඩ 02 සේවා ගණයේ කර්මාන්ත ප්‍රවර්ධන නිලධාරි තනතුර (IIශ්‍රේණිය) | II | I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 4 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ III ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | III | I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 5 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ II ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | II | II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 6 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | I | III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 7 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි තනතුරේ II ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | II | I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |
| 8 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී තනතුරේ I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | I | II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය |